ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ සහතික පත්‍ර වැඩ සටහන

පළමු සමාසික අවසාන පරීක්ෂණය 2006/2007

**ESC 1222/ESC 1233 -** ළමා මනෝ විද්‍යාව

කාලය පැය තුනයි.

---

දිනය - 2006.10.21 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

01. අධ්‍යයනය කිරීමේ පහසුව තකා සංවර්ධන මනෝ විද්‍යාඥයන් විසින් ළමා සංවර්ධනය මූලික ක්ෂේත්‍රවලට වෙන් කර දක්වා ඇත.

    එම එක් එක් ක්ෂේත්‍රය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 20)

02. "පෙර පාසල් ගුරුවරියක් වශයෙන් ළමයා හදා වඩා ගැනීම පිළිබඳව දෙමව්පියන් දැනුවත් කිරීම ද පෙර පාසල් ගුරුවරියක සතු කාර්යයකි."

    ළමා මනෝ විද්‍යාව පිළිබඳ ඔබගේ දැනුම උපයෝගී කර ගනිමින් දෙමවුපියන් දැනුවත් කිරීම සඳහා ඔබ ගන්නා ක්‍රියා මාර්ග පහත දැක්වෙන මාතෘකා යටතේ කෙටියෙන් පැහැදිලි කරන්න.

    (i) ළමයා තුළ සමාජීය කුසලතා සංවර්ධනය කිරීමට
    (ii) ළමයා තුළ නිර්මාණාත්මක හැකියා සංවර්ධනය කිරීමට

    (ලකුණු 20)

03. (i) ළමා අධ්‍යයන ශිල්ප ක්‍රමයක් ලෙස "නිරීක්ෂණ" ක්‍රමවේදය පෙර පාසල තුළ ඔබට භාවිතා කළ හැකි අවස්ථා දෙකක් (02) නම් කරන්න.

    (ලකුණු 02)

    (ii) නිරීක්ෂකයා විසින් ළමයින් නිරීක්ෂණය කිරීමේදී සැලකිලිමත් විය යුතු මූලික අංග දෙකක් (02) පැහැදිලි කරන්න.

    (ලකුණු 08)

    (iii) ගැටලු සහිත චර්යා දැක්වූ ළමුන් පිළිබඳව අධ්‍යයනය කිරීමකදී පෙර පාසල් ගුරුවරියක් විසින් පහත දැක්වෙන කරුණු රැස් කරන ලදී.

    (i) ළමයාගේ බුද්ධි මට්ටම
    (ii) ළමයාගේ සෞඛ්‍ය තත්ත්වය
    (iii) අධ්‍යාපනයේ ප්‍රගතිය

(iv) ළමයාගේ ගැටළුවලට හේතු විය හැකි යයි අනුමාන කරන කරුණු

මෙසේ දත්ත රැස් කිරීමට ඇය/ඔහු අනුගමනය කළ ක්‍රමවේදය කුමක් ද ?

(ලකුණු 02)

(iv) ඉහත ක්‍රමවේදය යොදා තොරතුරු එක් රැස් කිරීමේදී භාවිතා කළහැකි සැකැස්මක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 08)

04. (i) ළමුන් පංති කාමරය තුළ දක්වන අව ප්‍රමාණ චර්යා පහක් (05) නම් කරන්න. (ලකුණු 05)

(ii) ඉන් ඕනෑම දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) අව ප්‍රමාණ චර්යා ඇතිවීමට බලපාන හේතු සාධක දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 07)

05. "ආරය මගින් පුද්ගලයෙකුට කරන බලපෑම පරිසරය මගින් අවම කිරීම හෝ වෙනස් කිරීම කළ හැකි ය."

(i) ආරය මගින් තීරණය වේයයි සලකන සාධක තුනක් (03) නම් කරන්න. (ලකුණු 06)

(ii) ආරයෙන් පුද්ගලයෙකුට කරන බලපෑම පරිසරය මගින් අවම කෙරෙන හෝ වෙනස් කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 14)

06. (i) "පූර්ව ප්‍රසව අවධිය" විශේෂඥයන් විසින් මූලික අවධි තුනක (03) ට බෙදා ඇත. එම අවධි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(ii) පූර්ව ප්‍රසව අවධියේදී පරිසරාත්මක සාධක වැදගත් වීමට හේතු දක්වන්න. (ලකුණු 06)

(iii) පූර්ව ප්‍රසව අවධියේ දී කලලයට හානි කරන සාධක තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

07. (i) නවජ සූතියා යන්නෙන් අදහස් වන්නේ කවරෙක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii) නවජ සූතියාගේ මූලික අවශ්‍යතා හතරක් (04) පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(iii) නවජ සූතියාගේ හැකියාවන් පහක් (05) දක්වන්න.

(ලකුණු 10)

08. (i) දරු ප්‍රසූතියේ දී දරුවන්ට ඇතිවිය හැකි විවිධ අනතුරු වර්ග දෙකක් (02) නම් කරන්න.

(ලකුණු 05)

(ii) උපත් අනතුරකට ලක් වූ දරුවකු ඔබ පංති කාමරයේ සිටියි යයි උපකල්පනය කරන්න. එම දරුවා සඳහා ඔබ ඉගෙනුම් ඉගැන්වීම් අත්දැකීම් සංවිධානය කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

09. පහත දැක්වෙන ඕනෑම දෙකක් සඳහා කෙටි සටහන් ලියන්න.

(i) සමාජානුයෝගී ක්‍රියාවලිය
(ii) ස්වයං සම්ප්‍රජානනය ළමයා ලබා ගන්නා අයුරු
(iii) පෙර පාසල් වියේ දරුවකුගේ පොදු මනෝ චාලක හැකියා

(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -